# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 10 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 පෙබරවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 90 යි                                                                 තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 10 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 පෙබරවාරි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 96/80

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 40 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 10 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 40 දරන මෙට්‍රික් ඒකක (ආනුෂංගික විධිවිධාන) පනතේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :— 1978 අංක 40 දරන පනතේ උපලේඛනය සංශෝධනය කිරීම.

### උපලේඛනය

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| 1. විදුලිබල පනත. | 1. 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ 3 වන තීරයෙහි—<br>(i) "අඟලකට දම්වැල් 16ක්" යන වචන සහ අංක වෙනුවට "1 : 10000." යන අංක ;<br>(ii) "අඟලකට අඩි 20" යන වචන සහ අංක වෙනුවට "1 : 200." යන අංක ;<br>(iii) "අඟලකට අඩි 40" යන වචන සහ අංක වෙනුවට "1 : 500." යන අංක ;<br>(iv) "අඟලකට දම්වැල් 2" යන වචන සහ අංකය වෙනුවට "1 : 2000." යන අංක ;<br>(v) "අඟලකට සැතැප්ම 1" යන වචන සහ අංකය වෙනුවට "1 : 50,000." යන අංක<br>ආදේශ කරන්න.<br>2. 23 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අඩි තිස්තුන" යන වචන වෙනුවට "මීටර් 10" යන වචනය සහ අංක ආදේශ කරන්න.<br>3. 25 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "අඩි අටකට අඟලක්" සහ "සැතපුමට අඟල් දහසයක්" යන වචන වෙනුවට පිළිවෙලින් "1 : 100" සහ "1: 5000" යන අංක ආදේශ කරන්න.<br>4. 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අඩි එකසිය පනහක්" යන වචන වෙනුවට "මීටර් 45" යන වචනය සහ අංක ආදේශ කරන්න.<br>5. 38 වන වගන්තියේ "අඩි දෙසිය විසිපහක්" යන වචන වෙනුවට "මීටර් 65" යන වචනය සහ අංක ආදේශ කරන්න. |
| 2. පාන් ආඥාපනත. | 2 වන වගන්තිය වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරන්න :—<br>"බර අනුව පාන් විකිණීම, සහ පාන් ගෙඩිවල බර ලකුණු කිරීම.<br>2. (1) කිසිම බේකරිකරුවකු හෝ පාන් වෙළෙන්දකු, විසිතුරු පාන් හෝ රෝල් පාන් හැර ග්‍රෑම් දෙසිය විසි පහක, ග්‍රෑම් හාරසිය පණහක, ග්‍රෑම් නව සියයක හෝ ග්‍රෑම් එක් දහස් අට සියයක බරින් යුතු පාන් ගෙඩි වශයෙන් මිස පාන් නොවිකිණිය යුතු ය. |

| I වන තීරය ප්‍රඥප්තිය | II වන තීරය සංශෝධන |
|---|---|
| | (2) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත් ව, පාන් පිලිස්සීමේ දී උපස්ථිතිය මගින් පාන් ගෙඩිය මත එහි බර පැහැදිලිව ලකුණු කර ඇත්නම් හෝ පාන් ගෙඩිය ඔතා ඇති දවටනය මත හෝ එය වටා ඇති පටියක් මත එහි බර පැහැදිලිව ලකුණු කර ඇත්නම් මිස, කිසිම බේකරිකරුවකු හෝ පාන් වෙළෙන්දකු කිසිම පාන් ගෙඩියක් විකිණීම හෝ එවැනි යම් පාන් ගෙඩියක් විකිණීම සඳහා තැබීම හෝ නොකළ යුතු ය :<br><br>එසේ වුවද, මේ උපවගන්තියේ ඉහතින්වූ විධිවිධානවල කිසිවක්<br><br>(අ) විසිතුරු පාන් හෝ රෝල් පාන් හෝ බරෙන් ග්‍රෑම් දෙසිය විසිපහකට අඩු පාන් ගෙඩියක් සම්බන්ධයෙන් වන කල ; හෝ<br><br>(ආ) යම් ගිවිසුමක් හෝ එකඟවීමක් ප්‍රකාර යම් අවස්ථාවක දී කිලෝ ග්‍රෑම් පණහකට අඩු නොවන්නා වූ ප්‍රමාණයකින් සපයනු ලබන්නා වූ ද , බාර දෙන අවස්ථාවේ දී බර කිරා බලන්නා වූ ද පාන් සම්බන්ධයෙන් වන කල<br><br>අදාළ නොවේ." |
| 3. වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත. | 2 වන වගන්තියෙහි "වත්ත" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අර්ථ කථනය ආදේශ කරන්න :—<br><br>'"වත්ත" යන්නෙන් කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇත්තා වූ ද, තේ, රබර්, කෝපි, කොකෝවා, කරදමුංගු, පොල්, කපුරු, ගම්මිරිස් හෝ සින්කෝනා සැබැවින්ම වගා කර ඇත්තා වූ ද හෙක්ටෙයාර් හතරකින් යුත් යම් වත්තක් අදහස් වේ. '. |
| 4. රේගු ආඥාපනත. | 1. 10 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යොදන්න.<br><br>2. 10 වන වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උප වගන්තියට පසු පහත දක්වෙන උපවගන්තිය ඇතුළත් කරන්න :—<br><br>"(2) (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය යටතේ යම් මිනුම් ඒකක පදනම් කොට ගෙන වෙනස් කරන ලද හෝ පනවන ලද සෑම තීරු බද්දක්ම, පඩි සහ මිම් ආඥාපනතේ 5 වන වගන්තියෙහි අර්ථ කථනය කර ඇති ආකාරයට අන්තර් ජාතික ඒකක ක්‍රමය අනුව විය යුතු ය.". |

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| | 3. 17 වන වගන්තිය වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරන්න :— |
| | "ශ්‍රී ලංකාව සඳහා වූ මිනුම් ඒකක අනුව ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් තීරු බදු ගෙවිය යුතු බව.<br><br>17. ආඥාපනත යටතේ වූ සියලුම තීරු බදු මෙන්ම සියලු දණ්ඩන මෙහි ලා දක්වා ඇති විවිධ වර්ගවල මුදලින් හා නිශ්චිත විනිමය අනුපාතික අනුව, බ්‍රිතාන්‍ය රත්‍රං හෝ රිදී මුදලින් හෝ අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන වෙනත් මුදල් වර්ගයකින් හා විනිමය අනුපාතිකයක් අනුව ද ශ්‍රී ලංකාව සඳහා වූ මිනුම් ඒකක අනුව ද ගෙවීම හා බාර ගැනීම කළ යුතු ය.<br><br>තීරුබදුවල එකතුව භාණ්ඩාගාරය යනාදියට ගෙවිය යුතු බව.<br><br>තවද යම් නිශ්චිත ප්‍රමාණයක් අනුව හෝ යම් නිශ්චිත වටිනාකමක් අනුව හෝ ඒ තීරු බදු නියම කරනු ලැබ ඒ සඳහා ඉඩ දෙනු ලබන සියලු අවස්ථාවන්හි දී එම තීරුබද්ද එම අනුපාතය අනුව යම් වැඩි හෝ අඩු ප්‍රමාණයකට හෝ වටිනාකමට අදාළ වන්නේ යයි සලකනු ලැබිය යුතු ය. තවද සියලු තීරු බදු වල එකතුව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට හා කාලවල දී අයකැමි විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයාට හෝ ශ්‍රී ලංකාවේ උප ගණකාධිකාරිවරයන්ට හෝ ගෙවිය යුතු ය.". |
| 5. නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත. | ආඥාපනතේ උපලේඛනය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—<br><br>(1) එම උපලේඛනයේ 2 වන රීතියේ (3) වන ඡේදයේ "අඩි 4 " යන වචනය සහ අංකය වෙනුවට "මීටර් 1.2" යන වචනය සහ අංක ආදේශ කිරීමෙන් ;<br><br>(2) එම උපලේඛනයේ 3 වන රීතියේ—<br><br>(i) (අ) ඡේදයේ—<br><br>(අ) "අඩි 9" යන වචනය සහ අංකය වෙනුවට "මිලි මීටර් 2700" යන වචන සහ අංක;<br><br>(ආ) "අඩි 7 " යන වචනය සහ අංකය වෙනුවට "මිලිමීටර් 1200" යන වචනය සහ අංක ආදේශ කිරීමෙන් ;<br><br>(ii) එම රීතියේ (ආ) ඡේදයේ—<br><br>(අ) "වර්ග අඩි 120" යන වචන සහ අංක වෙනුවට "වර්ග මීටර් 11.1" යන වචන සහ අංක ;<br><br>(ආ) "වර්ග අඩි 90" යන වචන සහ අංක වෙනුවට "වර්ග මීටර් 8.3" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් ;<br><br>(iii) එම රීතියේ (ඇ) ඡේදයේ "අඩි 8" යන වචනය සහ අංකය වෙනුවට "මිලි මීටර් 2400" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් ; |

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
| --- | --- |
| | (iv) එම රීතියේ (ඉ) ඡේදයේ "අඩි 6" යන වචනය සහ අංකය වෙනුවට "මිලි මීටර් 1800" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් ; |
| | (v) එම රීතියේ (ඊ) ඡේදයේ "වර්ග අඩි 8" යන වචන සහ අංකය වෙනුවට "වර්ග මීටර් . 74" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් ; |
| | (vi) එම රීතියේ (උ) ඡේදයේ "අඩි එකහමාර" යන වචන වෙනුවට "මිලි මීටර් 500" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් ; |
| | (3) එම උපලේඛනයේ 4 වන රීතියේ |
| | (i) (ආ) ඡේදයේ "අඩි 7 1/2" යන වචනය සහ අංක වෙනුවට "මිලි මීටර් 2200" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් ; |
| | (ii) දෙවන අතුරු වගන්තියේ "අඩි 15 " යන වචනය සහ අංක වෙනුවට "මීටර් 4.5" යන වචනය සහ අංක ආදේශ කිරීමෙන් ; |
| | (4) එම උපලේඛනයේ 5 වන රීතියේ (1) වන ඡේදයේ— |
| | (i) කවර වූ හෝ ස්ථානයක "අඩි 7 1/2" යන වචනය සහ අංක යෙදෙන්නා වූ අවස්ථාවක ඒ වෙනුවට "මීටර් 2.2" යන වචනය සහ අංක ආදේශ-කිරීමෙන් ; |
| | (ii) කවර වූ හෝ ස්ථානයක "අඩි 20" යන වචනය සහ අංක යෙදෙන්නා වූ අවස්ථාවක ඒ වෙනුවට "මීටර් 6" යන වචනය සහ අංකය ආදේශ කිරීමෙන් ; |
| | (iii) "අඩි 3" යන වචනය සහ අංකය වෙනුවට "මීටර් .9" යන වචනය සහ අංකය ආදේශ කිරීමෙන්; |
| | (5) එම උපලේඛනයේ 8 වන රීතියේ |
| | (i) එම රීතියේ (1) වන ඡේදයේ— |
| | (අ) "අඩි 40" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 12" යන වචනය සහ අංක ; |
| | (ආ) "අඩි 10" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 3" යන වචනය සහ අංකය ; |
| | (ඇ) "අඩි 15" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 4.5" යන වචනය සහ අංක ; |
| | (ඈ) "අඩි 20" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 6" යන වචනය සහ අංකය ; |
| | (ඉ) "අඩි 18" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 5.4" යන වචනය සහ අංක ආදේශ කිරීමෙන් ; |
| | (ii) එම රීතියේ (2) වන ඡේදයේ— |
| | (අ) "අඩි 30" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 9 " යන වචනය සහ අංකය ; |
| | (ආ) "අඩි 20" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 6" යන වචනය සහ අංකය ආදේශ කිරීමෙන් ; |

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| | (iii) එම රීතියේ (3) වන ඡේදයේ "අඩි 15" යන වචනය සහ අංක වෙනුවට "මීටර් 4.5" යන වචනය සහ අංක ආදේශ කිරීමෙන් ; |
| | (6) එම උපලේඛනයේ 9 වන රීතියේ "වර්ග අඩි 1000" යන වචන සහ අංක වෙනුවට "වර්ග මීටර් 92.9" යන වචන සහ අංක ආදේශ කිරීමෙන්. |
| 6. රබර් පාලන පනත. | 1. 16 වන වගන්තිය වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරන්න ;— |

"බලපත්‍රලත් ස්ථානයෙහි තරාදි තබාගත යුතු බව.

16. බලපත්‍රලත් සෑම වෙළෙන්දකු විසින්ම ස්වකීය බලපත්‍රලත් ස්ථානයෙහි කිලෝග්‍රෑම් පණහක් දක්වා කිරිය හැකි තරාදියක් තබා ගත යුතු අතර පාලක විසින් හෝ පාලක විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් හෝ ඒ ස්ථානයෙහි ඇති යම් රබර් ප්‍රමාණයක් කිරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට එසේ කිරනු ලැබීමට සැලැස්විය යුතු ය ; තවද එම ස්ථානයෙහි ඇති රබර් තොගයේ බර 15 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන සටහනෙහි දක්වෙන බර ප්‍රමාණයන් සමග සංසන්දනය කිරීමට පාලකට හෝ ඒ බලය දෙනු ලැබූ නිලධරයාට හෝ අවසර දීම සහ සියලු පහසුකම් සැලසීම හා සහාය දීම ඔහු විසින් කළ යුතුය.".

2. 25 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති වෙනුවට පහත සඳහන් උපවගන්ති ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—

"(1) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම රබර් කිලෝග්‍රෑම් සියයක් සඳහා පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන අනුප්‍රමාණයට ආගණනය කරනු ලැබූ අපනයන තීරු බද්දක් ඒ රබර් සම්බන්ධයෙන් අය කිරීම, ලබා ගැනීම සහ ගෙවීම කළ යුතු ය. එවැනි සෑම යෝජනා සම්මතයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය :

එසේ වුවද නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති බවට ප්‍රධාන රේගු අයකැමි සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූ රබර් කිසිදු ප්‍රමාණයක් සඳහා ඒ තීරුබද්ද අය කිරීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුතුය.

(2) මෙ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පනවන ලද තීරු බද්දක ප්‍රමාණය වෙනස් කිරීම හෝ පනවන ලද තීරු බද්ද පරිච්ඡින්න කිරීම හෝ පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් ඕනෑම විටකදී කරනු ලැබිය හැකි ය. ඒ යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කිරීමේ දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.".

3. 52 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "වත්ත" යන්නෙහි සහ "කුඩා ඉඩම" යන්නෙහි අර්ථ කථන වෙනුවට පහත සඳහන් අර්ථ කථන ඒ වගන්තියෙහි පිළිවෙළින් ආදේශ කරන්න :

| I වන තීරය<br>ප්‍රඥප්තිය | II වන තීරය<br>සංශෝධන |
|---|---|
| | ' ''වත්ත'' යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරකට වඩා නොඅඩු වූද රබර් කිරි රැස්කර ගැනීමේ කාර්යය සඳහා රබර් පැල වගා කර ඇත්තා වූ ද යම් බිම් ප්‍රදේශයක් අදහස් වේ ;<br><br>''කුඩා ඉඩම'' යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරකට වඩා අඩු වූද රබර් කිරි රැස් කිරීමේ කාර්යය සඳහා රබර් පැල වගා කර ඇත්තා වූ බිම් ප්‍රදේශයක් අදහස් වේ.'. |
| 7. රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත. | 7 වන වගන්තියේ—<br>(1) (1) වන, (2) වන සහ (3) වන උපවගන්ති වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කරන්න :—<br><br>''(1) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම ෂීට් රබර් කිලෝ ග්‍රෑමයක් සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන අපනයන තීරු බද්දක් අය කිරීම, ලබා ගැනීම හා ගෙවීම කළ යුතු ය.<br><br>(2) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම කැබලි ක්‍රෙප් රබර් කිලෝග්‍රෑමයක් සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන අපනයන තීරු බද්දක් අය කිරීම, ලබා ගැනීම හා ගෙවීම කළ යුතු ය.<br><br>(3) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සෑම ක්‍රෙප් රබර් කිලෝග්‍රෑමයක් සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන අපනයන තීරු බද්දක් අයකිරීම, ලබාගැනීම හා ගෙවීම කළ යුතුය.''.<br><br>(2) එම වගන්තියේ (5) වන උපවගන්තිය අත් හරින්න. |
| 8. රබර් පර්යේෂණ ආඥාපනත. | 6 වන වගන්තියේ (4) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—<br><br>''(4) (1) වන උපවගන්තිය යටතේ වූ තීරු බද්ද ආගණනය කිරීමේ කාර්යය සඳහා ද්‍රව රබර් කිරි එක් ලීටරයක් වියලි රබර් කිලෝ ග්‍රෑම් එකකින් ඒකක තුන්සිය පණහකට සමාන ලෙස සලකනු ලැබිය යුතු අතර කැටි ගැසුණු රබර් කිරි කිලෝ ග්‍රෑම් එකහමාරක් වියලි රබර් කිලෝ ග්‍රෑම් එකකට සමාන ලෙස සලකනු ලැබිය යුතුය.''. |
| 9. රජයේ ඉඩම් ආඥා පනත. | 1. 55 වන වගන්තියේ (5) වන ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—<br><br>''(5) පොදු රථ මාර්ගයක හෝ කරත්ත පාරක මැද සිට මීටර දහයක දුරක් ඇතුළත පිහිටියා වූ හෝ ප්‍රසිද්ධ අධිපාරක මැද සිට මීටර තුනක දුරක් ඇතුළත පිහිටියා වූ හෝ පුද්ගලික දේපළක් නොවන්නා වූ සියලු මුඩුබිම්.''.<br><br>2. 63 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ''සැතපුම් එකක්'' යන වචන වෙනුවට ''මීටර එක්දහස් හයසියයක්'' යන වචන ආදේශ කරන්න.<br><br>3. 96 වන වගන්තියේ (7) වන ඡේදයේ ''අඩි 5000 ක්'' යන වචනය සහ අංක වෙනුවට ''මීටර එක් දහස් හයසියයක්'' යන වචන ආදේශ කරන්න.<br><br>4. 101 වන වගන්තියේ ''අඩි 5000 ක්'' යන වචනය සහ අංක වෙනුවට ''මීටර එක් දහස් හයසියයක්'' යන වචන ආදේශ කරන්න. |

| I වන තීරය ප්‍රඥප්තිය | II වන තීරය සංශෝධන |
|---|---|
| | 5. එම ආඥාපනතේ පළමුවන උපලේඛනයේ "අක්කර දෙළහයි රූඩ තුනයි පර්චස් දහයක් සහ පර්ච් එකකින් දහයෙන් හත් පංගුවක් (අක්. 12 රූඩ 3 පර්චස් 10.7)" යන වචන සහ අංක වෙනුවට "හෙක්ටෙයාර් 5.1867" යන වචනය සහ අංක ආදේශ කරන්න. |
| 10. ඉඩම් සංවර්ධන ආඥාපනත. | 156 වන වගන්තියේ (ආ) ඡේදයේ "අඩි 5000 ක්" යන වචන සහ අංක වෙනුවට "මීටර් එක් දහස් හයසියයක්" යන වචන ආදේශ කරන්න. |
| 11. 1957 අංක 51 දරන තේ පාලන පනත. | 1. 18 වන වගන්තියේ (4) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :-<br><br>"(4) බලපත්‍රලත් සෑම වෙළෙන්දකු විසින් ම ස්වකීය බලපත්‍රලත් ස්ථානයෙහි ද මේ වගන්තියේ (3) වන උප වගන්තිය අදාළ වන සෑම නිෂ්පාදකයකු විසින් ම ස්වකීය තේ කර්මාන්ත ශාලාවෙහි ද කිලෝග්‍රෑම් පණිහක් දක්වා කිරිය හැකි තරාදි තබා ගත යුතු ය :<br><br>එසේ වුවද ලියාපදිංචි කළ අසුරන්නකු විසින් අසුරනු ලැබූ සෑදූ තේ පමණක් වෙළඳාම් කරන බලපත්‍රලත් වෙළෙන්දකු විසින් මේ උපවගන්තියෙහි සඳහන් තරාදි ස්වකීය බලපත්‍ර ලත් ස්ථානයෙහි තබා ගැනීම අවශ්‍ය නො වන්නේ ය.".<br><br>2. 63 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "වත්ත" යන්නෙහි සහ "කුඩා ඉඩම" යන්නෙහි අර්ථ කථන වෙනුවට පහත සඳහන් අර්ථ කථන ඒ වගන්තියෙහි පිළිවෙලින් ආදේශ කරන්න :—<br><br>' "වත්ත" යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරක් හෝ ඊට වැඩි වූ ද සෑදූ තේ වලට පරිවර්තනය කරනු පිණිස එහි දළු නෙලා ගැනීමේ කාර්යය සඳහා තේ පැලෑටි වගා කර ඇත්තා වූ ද බිම් ප්‍රදේශයක් අදහස් වේ;<br><br>"කුඩා ඉඩම" යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතරකට වඩා අඩු වූ ද සෑදූ තේ වලට පරිවර්තනය කරනු පිණිස එහි තේ දළු නෙලා ගැනීමේ කාර්යය සඳහා තේ පැලෑටි වගා කර ඇත්තා වූ ද බිම් ප්‍රදේශයක් අදහස් වේ;' |
| 12. 1958 අංක 2 දරන තේ හා රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනත. | 1. 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—<br>"(1) පහත සඳහන් අවස්ථාවල දී එනම් :—<br>(අ) තේ හෝ රබර් වත්තක් කැබලි ගණනකට බෙදීමක් ඇතුළත් නොවන ඒ තේ හෝ රබර් වත්තේ අයිතිය පැවරීමට;<br><br>(ආ) (i) යම් තේ හෝ රබර් වත්තක් කැබලිවලට බෙදිය යුතුව ඇත්නම් හෝ බෙද වෙන් කළ යුතුව ඇත්නම් ඒ සියලු කැබලි, නැතහොත් ඒ සියලු කැබලි ඉන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතලිහකට නොඅඩු එක් කැබැල්ලක් හැර නිවාස තැනීමේ අරමුණක් ලෙස ජාතික නිවාස පනතේ 2 වන වගන්තියෙන් ප්‍රකාශ කරනු ලැබූ අරමුණක් සඳහා, හෝ යම් කාර්මික කටයුත්තක් සඳහා, හෝ නගරයක් සංවර්ධනය කිරීම සඳහා, හෝ වෙනයම් නියමිත කාර්යයක් සඳහා පාවිච්චි කළ යුතුව ඇත්නම්, හෝ යාබද තේ හෝ රබර් වත්තක් සමඟ සම්බන්ධ කළ යුතුව ඇත්නම්, සහ ඒ |

| I වන තීරය ප්‍රදේශය | II වන තීරය සංශෝධන |
|---|---|
| | සම්බන්ධ කිරීමෙන් එසේ සම්බන්ධ කරනු ලැබූ ඉඩම් වල වඩා කාර්යක්ෂමවූත් සකසුරුවම් සහිතවූත් කළමනාකරණයක් ඇති වේ යයි මණ්ඩලය අදහස් කරන්නේ නම්; |
| | (ii) යම් තේ හෝ රබර් වත්තක කෘෂිකාර්මික තත්ත්වය දැනටමත් නොපමණ අසතුටුදායක දයි කියතහොත්, ඒ තේ හෝ රබර් වත්ත බෙදීම හෝ කැබලිවලට බෙද වෙන් කිරීම හෝ මණ්ඩලයේ මතය අනුව ඒ තත්ත්වය කෙරෙහි හානි කර අන්දමින් බලපෑමට ඉඩ නොමැති නම්; හෝ |
| | (iii) යම් තේ හෝ රබර් වත්තක් බෙදිය යුතුව ඇත්තේ හෝ බෙද වෙන් කළ යුතුව ඇත්තේ යම් කැබලි ප්‍රමාණයකට ද ඒ එක් එක් කැබැල්ල තේ වත්තක් සම්බන්ධයෙන් වූ විට ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් දෙසියයකට නොඅඩු නම් සහ රබර් වත්තක් සම්බන්ධයෙන් වූ විට, හෙක්ටෙයාර් සියයකට නොඅඩු නම්, සහ ඒ තේ හෝ රබර් වත්ත බෙදීම හෝ කැබලිවලට බෙද වෙන් කිරීම, මණ්ඩලයේ මතය අනුව, දේපළෙහි කෘෂිකාර්මික තත්ත්වය හෝ එහි කාර්යක්ෂම කළමනාකරණය කෙරෙහි හානි කර අන්දමින් බල නොපාන්නේ නම්; |
| | එම තේ හෝ රබර් වත්ත කැබලි ගණනකට බෙදීමක් ඇතුළත්ව එම තේ හෝ රබර් වත්තේ අයිතිය පැවරීමට, හෝ එම තේ හෝ රබර් වත්ත ඔප්පුවකින් බෙද වෙන් කිරීමට, හෝ එම තේ හෝ රබර් වත්ත සම්බන්ධයෙන් බදුම් හඩුවක් පැවරීමට මණ්ඩලය විසින් ස්වකීය කැමැත්ත දිය යුතුය.". |

2\. 9 වන වගන්තිය වෙනුවට, පහත සඳහන් වගන්තිය ආදේශ කරන්න :—

| | |
|---|---|
| "1957 අංක 51 දරන තේ පාලන පනත හා රබර් පාලන පනත යටතේ ඇතැම් වතු හා කුඩා ඉඩම් ලියා පදිංචි කිරීම තහනම් කිරීම. | 9.(1) 1957 අංක 51 දරන තේ පාලන පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, නියමිත දිනයෙහි හෝ ඉන් පසු තේ වත්තක් කැබලිවලට බෙදීමෙන් සංස්ථාපිත ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් දෙසියයකට අඩු වත්තක් හෝ කුඩා ඉඩමක් හෝ මණ්ඩලයේ පූර්ව කැමැත්ත ඇතිව සහ ඒ කැමැත්ත දෙන ලද්දේ කොන්දේසි කිසිවකට යටත් ව නම් ඒ කොන්දේසි වලට අනුකූලව, ඒ තේ වත්තේ අයිතිය පැවරීමක හෝ එය බෙද වෙන් කිරීමක හෝ ප්‍රතිඵලයක් වශයෙන් ඒ බෙදීම කරනු ලැබ ඇත්නම් මිස, ඒ පනත යටතේ ලියාපදිංචි නොකරනු ලැබිය යුතු ය. මේ උප වගන්තියෙහි "කුඩා ඉඩම" යන යෙදුමට 1957 අංක 51 දරන තේ පාලන පනතෙහි එයට දී ඇති අර්ථයම ඇත්තේ ය. |

| I වන තීරුව ප්‍රඥප්තිය | | II වන තීරුව සංශෝධන |
|---|---|---|
| | | (2) රබර් පාලන පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, නියමිත දිනයෙහි හෝ ඉන් පසු රබර් වත්තක් කැබලිවලට බෙදීමෙන් සංස්ථාපිත ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් සියයකට අඩු වත්තක් හෝ කුඩා ඉඩමක් හෝ, මණ්ඩලයේ පූර්ව කැමැත්ත ඇතිව සහ කැමැත්ත දෙන ලද්දේ කොන්දේසි කිසිවකට යටත් ව නම් ඒ කොන්දේසිවලට අනුකූලව ඒ රබර් වත්තේ අයිතිය පැවරීමක හෝ එය බෙදා වෙන් කිරීමක හෝ ප්‍රතිඵලයක් වශයෙන් ඒ බෙදීම කරනු ලැබ ඇත්නම් මිස, ඒ පනත යටතේ ලියාපදිංචි නොකරනු ලැබිය යුතු ය. මේ උපවගන්තියෙහි ''කුඩා ඉඩම'' යන යෙදුමට රබර් පාලන පනතෙහි එයට දී ඇති අර්ථයම ඇත්තේ ය.''. |
| | | 3. 25 වන වගන්තියේ ''රබර් වත්ත'' යන්නෙහි සහ ''තේ වත්ත'' යන්නෙහි අර්ථ කථන වෙනුවට පහත සඳහන් අර්ථ කථන පිළිවෙලින් ආදේශ කරන්න :—<br>' ''රබර් වත්ත'' යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතළිහකට නොඅඩු වූ ද, රබර් පාලන පනත යටතේ ලියාපදිංචි කරන ලද්ද වූ ද නැතහොත් ඒ පනත යටතේ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන්නා වූ ද රබර් වත්තක් අදහස් වේ;<br>''තේ වත්ත'' යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් හතළිහකට නොඅඩු වූ ද, 1957 අංක 51 දරන තේ පාලන පනත යටතේ ලියා පදිංචි කරන ලද්ද වූ ද නැතහොත් ඒ පනත යටතේ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන්නා වූ ද තේ වත්තක් අදහස් වේ;' . |
| | 1958 අංක 19 දරන වතුකඩවීදි (අනිවාර්ය අත්කර ගැනීම) පනත. | 6 වන වගන්තියේ ''වත්ත'' යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත සඳහන් අර්ථකථනය ඒ වගන්තියෙහි ආදේශ කරන්න:—<br>' ''වත්ත'' යන්නෙන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් අටකට නොඅඩු වූ ද වෙන් වූ සහ පැහැදිලි දේපළක් සංයුක්ත කරන්නා වූ ද වගාකරන ලද හෝ වගා නොකරන ලද යම් ඉඩමක් හෝ ඉඩම් සමූහයක් අදහස් වන නමුත් ඊට 1958 අංක 2 දරන තේ සහ රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පනතේ 11 වන වගන්තිය යටතේ අයිතිය පැවරීම සඳහා ඉල්ලීමක් කර ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද එවැනි දේපළක් ඇතුළත් නොවේ.' . |
| 14. | 1959 අංක 16 දරන තේ (බදු සහ අපනයන පාලන) පනත. | 12 වන වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උප වගන්ති වෙනුවට පහත සඳහන් උපවගන්ති ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—<br>''කොළඹ තේ වෙන්දේසියකදී විකුණනු ලබන තේ සහ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන විදේශ තේ වෙන්දේසියකදී විකුණනු ලබන තේ සඳහා බදු.<br>2. (1) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ප්‍රකාර ප්‍රකාශ කරනු ලැබූ විට සහ (3) වන උපවගන්තියෙහි සඳහන් අඩු කිරීම ඉන් අඩු කිරීමෙන් පසු කොළඹ තේ වෙන්දේසියක දී තත් කාලයේ දී තේ විකුණනු ලබන මිල ගණන් සැලකිල්ලට ගෙන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන්නා වූ මිලකට අධික වූ, මිලකට යම් තේ ප්‍රමාණයක්—<br>(අ) කොළඹ තේ වෙන්දේසියක දී විකුණනු ලබන අවස්ථාවක, හෝ |

I වන තීරය
ප්‍රඥප්තිය

II වන තීරය
සංශෝධන

(ආ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබ විදේශ තේ වෙන්දේසියක දී විකුණනු ලබන අවස්ථාවක,

එසේ විකුණනු ලබන එක් එක් තේ කිලෝ ග්‍රෑමයක් වෙනුවෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන්නා වූ අනු ප්‍රමාණයකට බද්දක් අය කිරීම, ලබා ගැනීම හා ගෙවීම කළ යුතුය:

එසේ වුවද, මේ අතුරු වගන්තිය නිසා නොවේ නම්, කොළඹ තේ වෙන්දේසියක පැවැත්වෙන ප්‍රථම නැවත විකිණීමක දී යම් තේ ප්‍රමාණයක් වෙනුවෙන් මේ උපවගන් තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ගෙවිය යුතු බද්ද, ඒ නැවත විකිණීමට පෙර එවැනි වෙන්දේසියක දී එම තේ විකිණීම සම්බන්ධ යෙන් ඒ තේ වෙනුවෙන් එම විධිවිධාන යටතේ ගෙවිය යුතු බද්දට අධික වන අවස්ථාවක, එම ප්‍රථම නැවත විකිණීම සම්බන්ධයෙන් එම තේ වෙනුවෙන්, එකී විධිවිධාන යටතේ ගෙවිය යුතු බද්ද වෙනුවට, ඒ අධිකයේ ප්‍රමාණයට සමාන බද්දක් අයකිරීම, ලබා ගැනීම හා ගෙවීම කළ යුතු ය.

(2) විදේශ තේ වෙන්දේසියක දී විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑමයක් එවැනි වෙන්දේසියකදී කිසියම් දවසක විකුණනු ලබන්නේ යම් මිලකටද ඒ මිල ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ප්‍රකාර ප්‍රකාශ කිරීමේ කාර්ය සඳහා විනිමය අනුපාතිකය රේගු ආඥාපනතේ 17 වන වගන්තිය යටතේ දක්වා ඇත්තා වූද එම දිනයෙහි බලපවත්වන්නා වූ ද විනිමය අනුපාතිකයම වන්නේය.

(3) විදේශ තේ වෙන්දේසියක දී විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑමයක් එවැනි වෙන්දේසියක දී විකුණනු ලබන්නේ යම් මිලකට ද ඒ මිලෙන් (1) වන උපවගන්තියේ කාර්යය සඳහා පහත සඳහන් අඩු කිරීම් කළ යුතු ය—

(අ) එම තේ කිලෝග්‍රෑමය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දී ගෙවනු ලැබූ අපනයන තීරු බද්ද සහ යම් අධිකයක්, සහ

(ආ) එවැනි විදේශ තේ වෙන්දේසියක දී විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් අප නයනය කරන ලද තේ කිලෝග්‍රෑමයක් සම්බන්ධයෙන් නැව් ගාස්තු, රක්ෂණය සහ පැටවීම, ගොඩබෑම් ආදී වියදම් පියවීමට ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ මුදල.".

| I වන තීරය ප්‍රදේශය | II වන තීරය සංශෝධන |
|---|---|

2. (1) 5 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති වෙනුවට පහත සඳහන් උපවගන්ති ඒ වගන්තියෙහි පිළිවෙලින් ආදේශ කරන්න :—

" (1) මේ වගන්තියෙහි මින් මතු " තක්සේරු කළ මිල " යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද—

(අ) ඉංගිලිෂ් ඇන්ඩ් ස්කොට්ෂ් ජොයින්ට් කෝපරේටිව් හෝල් සේල් සොසයිටි ලිමිටඩ් නමැති සමාගම විසින් ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කරන ලද යම් තේ; හෝ

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි හෝ සඳහන් තේ නොවන්නාවූ සහ මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට බලය දෙනු ලැබ ඇත්තාවූ යම් තේ

කිලෝග්‍රෑමයක් යම් දිනයක කොළඹ තේ වෙන්දේසියකදී විකුණනු ලැබුවේ නම් ඒ දිනයෙහි උපයා ගැනීමට සාධාරණව අපේක්ෂා කරනු ලබන්නා වූ ද මිල, කොළඹ තේ වෙන්දේසියක දී තේ විකුණනු ලබන පවත්නා මිල පදනම් කර ගෙන කොමසාරිස්වරයා විසින් (2) වන උපවගන්තියෙහි කාර්ය සඳහා නිශ්චය කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන්නා වූ යම් තේ ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට බලය දෙමින් මේ පනත යටතේ වූ බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ඒ තේ සෑම කිලෝග්‍රෑමයක්ම වෙනුවෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන්නා වූ නියමයක් මගින් නිශ්චය කරනු ලබන අනුප්‍රමාණයක බද්දක් අය කිරීම, ලබා ගැනීම හා ගෙවීම කළ යුතු ය. (1) වන උපවගන්තියේ සඳහන් " තක්සේරු කළ මිල " අනුසාරයෙන් ඒ අනුප්‍රමාණය නිශ්චය කළ යුතු ය.".

3. 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත සඳහන් අතුරු වගන්තිය ඒ වගන්තියෙහි ආදේශ කරන්න :—

" එසේ වුවද—

(අ) තෑගයක් වශයෙන් පාර්සල් තැපෑලෙන් යවනු ලබන හෝ මගියකුගේ පෞද්ගලික ගමන් බඩු වල කොටසක් වශයෙන් යම් යාත්‍රාවක හෝ ගුවන් යානාවක ගෙන යනු ලබන බරින් කිලෝග්‍රෑම් හයකට වැඩි නොවන්නා වූ යම් තේ ප්‍රමාණයක්, හෝ

(ආ) වාණිජ සැම්පල් වශයෙන් යවනු ලබන යම් තේ ප්‍රමාණයක්,

අපනයනය කිරීම සඳහා කිසිම බලපත්‍රයක් අවශ්‍ය නොවන්නේ ය.".

| I වන තීරය ප්‍රඥප්තිය | II වන තීරය සංශෝධන |
| --- | --- |
| | 4. 12 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති වෙනුවට පහත දක්වෙන උපවගන්ති ඒ වගන්තියෙහි ආදේශ කරන්න :— <br><br> " (1) යම් තේ ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියක දී විකුණනු ලබන අවස්ථාවක, එම විකිණීම කරනු ලබන අවස්ථාවේ දී තේ වල අයිතිකරු වන තැනැත්තා විසින්, විකිණීමේ දිනයෙන් පසු වැඩ කරන දින තුනක් පසු නොවී ඒ තේ වල විස්තරය, ප්‍රමාණය සහ එක කිලෝග්‍රෑමයක විකුණුම් මිල ද ගැනුම් කරුගේ නම සහ ලිපිනයද කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය. <br><br> (2) විදේශීය තේ වෙන්දේසියක දී විකිණීම සඳහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ යම් තේ ප්‍රමාණයක් එවැනි වෙන්දේසියක දී විකුණනු ලබන අවස්ථාවක එම විකිණීම කරනු ලබන අවස්ථාවේ දී තේ වල අයිතිකරු වන තැනැත්තා විසින්, විකිණීමේ දිනයෙන් පසු දින දහතරක් පසු නොවී ඒ තේ වල විස්තරය, ප්‍රමාණය සහ එක කිලෝ ග්‍රෑමයක විකුණුම් මිලද, ගැනුම් කරුගේ නම සහ ලිපිනය ද කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.". |
| 15. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත. | 1. 13 වන වගන්තියේ— <br> (1) (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි " රුපියල් විසිපහයි යත හැත්තෑවක අනු ප්‍රමාණයකට " යන වචන වෙනුවට " අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි වූ අනු ප්‍රමාණයකට " යන වචන ආදේශ කරන්න. <br><br> (2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි " මේ වගන්තිය මගින් " යන වචන වෙනුවට " මේ වගන්තිය යටතේ " යන වචන ආදේශ කරන්න . <br><br> 2. 31 වන වගන්තියෙහි— <br> (අ) " වත්ත " යන්නේ අර්ථ කථනයෙහි " අක්කර දහයක් " යන වචන වෙනුවට " හෙක්ටෙයාර් හතරක් " යන වචන; සහ <br> (ආ) " කුඩා ඉඩම " යන්නේ අර්ථකථනයෙහි " අක්කර දහයකට " යන වචන වෙනුවට " හෙක්ටෙයාර් හතරකට " යන වචන <br> පිළිවෙලින් ආදේශ කරන්න. |

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයිමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.